රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2022

මගේ අංකය : EST-6/03/LEA/1060
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.04.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින 02ක් ප්‍රකාශයට පත් කිරීම</u>**

අප්‍රේල් 08 වන දින සහ එළඹෙන සිංහල හා දෙමළ අලුත් අවුරුද්දෙන් පසු කාර්යාල විවෘත වන අප්‍රේල් 18 වන දින දක්වා කාලය තුළ අප්‍රේල් 11 සහ 12 දින දෙක පමණක් රජයේ කාර්යාල විවෘතව තැබිය යුතුව ඇත.

02. ඉහත සඳහන් පරිදි අප්‍රේල් 11 සහ 12 දෙදින රජයේ කාර්යාල විවෘත කළ ද එම දිනයන්හි නිලධරයන්ගේ සහ සේවාලාභීන්ගේ පැමිණීමෙහි අඩුවීමක් අපේක්ෂා කළ හැකි බැවින් එම දින දෙක කාර්යාල විවෘත කර තැබීමට දැරිය යුතු වියදමට සාපේක්ෂව ලැබෙන ප්‍රතිඵලය අඩු විය හැක. එම තත්ත්වය සැලකිල්ලට ගෙන අප්‍රේල් 11 සහ 12 දෙදින රජයේ කාර්යාල සඳහා විශේෂ නිවාඩු දින දෙකක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

03. රජයේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට මෙයින් බාධාවක් නොවිය යුතු ය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය